# රබර් වගා කරුවන්ට කරදරයක් වී ඇති කුඩැල්ලන් මර්ධනය

නපිත් නිශාන්ත, ඩබ්. පී. කේ. සිල්වා සහ සී. කේ. ජයසිංහ

ශ්‍රී ලංකාවේ රබර් වගාකරුවන් නිරන්තරයෙන් මුහුණ පාන ගැටලුවක් ලෙස ක්ෂේත්‍රයේ කුඩැල්ලන් සිටීම හැඳින්විය හැක.

ප්‍රධාන වශයෙන්ම රබර් කිරි කැපීමේදී මෙම පරපෝෂිතයා කරදරකාරී සතෙකු වන අතර කිරි කැපුම් කරුවන් හට එක් කිරි කට්ටියක් කැපීමට වැඩි කාලයක් ගත වීමට හේතු වෙයි. එසේම කුඩැල්ලන් සපා කෑම නිසා සහ ලේ උරා බීම නිසා කිරි කැපුම්කරුවන්ට ශාරීරික ආපදාවන්ට ලක්වීමටත් සිදුවේ. එපමණක් නොව පොහොර දැමීම, වල් නෙලීම, අතුරු බෝග වගා කිරීම ආදී රබර් වගාව ආශ්‍රිත අනෙකුත් ක්ෂේත්‍ර කටයුතු වල යෙදෙන්නන්ටද කුඩැල්ලන්ගෙන් කරදරයක් වී ඇති අතර එම කටයුතු සිදුකිරීමටද බාධා ඇති කරයි.

එබැවින් මෙම පරපෝෂිතයන් මගින් සිදුකරන හානිය සළකා බැලීමේදී එය වක්‍රව රබර් කිරි අස්වැන්න අඩුවීමටද යම් ප්‍රමාණයකින් බලපාන අතර, කිරි කපන්නන් තුල එම වෘත්තියෙහි යෙදීමට පවතින කැමැත්ත අඩුවීමටද බලපානු ඇත. ඒ තුලින් රබර් කර්මාන්තයේ යෙදෙන රබර් වතු හිමියන් හට කිරි කැපුම්කරුවන් සොයා ගැනීමේදී යම් දුෂ්කරතාවයන්ට පත්වීමට සිදුවේ. තවද, රබර් වගාව ආශ්‍රිත පර්යේෂණවල යෙදෙන්නන්ටද රබර් වගාව සංවර්ධනයට උපදෙස් හා ආධාර සපයන ක්ෂේත්‍ර නිළධාරීන්ටද මෙම කුඩැල්ලන්ගෙන් එම කටයුතු සඳහා බාධා ඇති කරයි. සමස්ථයක් වශයෙන් බැලූ කල මෙම කුඩලු කරදරය ශ්‍රී ලංකාවේ රබර් නිෂ්පාදනය අඩු වීමට සුලු වශයෙන් හෝ හේතු වී තිබේ.

වර්ෂාව සහිත තෙත් කාලගුණික තත්ත්වයන් වලදී පොලොවෙහි පවතින තෙතමනය නිසා කුඩැල්ලන් සීඝ්‍රයෙන් ව්‍යාප්ත වේ. එබැවින් එවැනි දිනවල මෙම ප්‍රශ්නය වඩාත් තීව්‍ර ස්වරූපයක් ගනී.

මෙම ගැටලුවට පිළියම් වශයෙන් රබර් වගාකරුවන් නොයෙකුත් ද්‍රව්‍ය කුඩැල්ලන්ගෙන් ආරක්ෂා වීමට තම පාදවල ආලේප කරගෙන කිරි කැපීම සිදුකළත්, එම ද්‍රව්‍යයන් භාවිතයේ විධිමත් බවක් හා ප්‍රමිතියක් නොමැති බැවින් බොහොමයක් කිරි කැපුම් කරුවන්හට තවමත් සාර්ථක විසඳුමක් ලැබී නැත. එමෙන්ම ඇතැම් ආලේපන සමට අහිතකර ඒවා වන අතර නොදැනුවත්කම නිසා ඔවුන් එම ද්‍රව්‍යයන් භාවිතා කරයි.

මෙම කරදරකාරී සත්ත්වයාගෙන් ආරක්ෂා වී තම රබර් වගාවේ අස්වැන්න ලබාගැනීමටද අනෙකුත් ක්ෂේත්‍ර කටයුතු කරගැනීමටද හැකිවන පරිදි එම ගැටලුවට විසඳුම් වශයෙන් රබර් පර්යේෂණායතනය මගින් ක්ෂේත්‍රයේදී සහ රසායනාගාරයේදී පරීක්ෂණ ගණනනාවක් සිදුකිරීමෙන් අනතුරුව ලාභදායි මෙන්ම පහසුවෙන් සොයාගත හැකි ආලේපන කිපයක් සොයා ගන්නා ලදි. එම බොහොමයක් ඒවා දිනකට එක් කිරි කැපුම් කරුවකුගේ පාදවල ආලේප කිරීමට යන වියදම දළ වශයෙන් රුපියලක් පමණ වේ.

අප විසින් හඳුන්වා දෙන ආලේපයන්/රසායන ද්‍රව්‍යයන් අතරින් ප්‍රථමයෙන් පැගිරි තෙල් (Citronella Oil) සලකා බලමු. එම ද්‍රව්‍යය වෙළඳපොලෙන් පහසුවෙන් සොයාගත හැකි වන අතර මිළ අධිකද නොවේ. දිනකට එක් කිරි කැපුම් කරුවකුට තම පාදවල ආලේප කිරීමට පැගිරි තෙල් මිලි. ලිටර්

5 ක් ප්‍රමාණවත් වන අතර එම ප්‍රමාණනයට යන වියදම රුපියලකි. පැගිරි තෙල්වල කුඩැල්ලන් විකර්ශනය කිරීමේ හැකියාව ඉතා ඉහල මට්ටමක පවතින අතර මෙය ඉතා සුදුසු ආලේපනයකි.

තවත් හොඳ කුඩලු විකර්ශකයක් ලෙස Dettol/ඩෙටෝල් භාවිතා කල හැක. මේ සඳහා වෙළඳපොලේ පවතින ඩෙටෝල් එක් කොටසක් වතුර කොටස් නවයක් සමග කලවම් කර සාදාගත් ද්‍රාවණය භාවිතා කළ යුතුය. ඩෙටොල් වෙළඳ පොලෙන් පහසුවෙන් ලබාගත හැකි අතර එක් කිරි කැපුම් කරුවෙක් සඳහා දිනකට රු. 1 ශත 20 ක පමණ මුදලක් වැය කොට ඩෙටෝල් ආලේප කර කුඩැල්ලන්ගෙන් ආරක්ෂා විය හැක.

ඊළඟ ආලේපනය ලෙස දුම්කොළ සාරය හඳුන්වා දිය හැක. මෙම ද්‍රව්‍යයද ඉතා පහසුවෙන් සොයාගත හැකි, මිලෙන් අඩු, දුම්බීම සඳහා ගන්නා බාල වර්ගයේ දුම්කොළ වන අතර සාරය වෙන්කරවා ගත්විට එය ඉතා හොඳ කුඩලු විකර්ශනයකි. දුම්කොළ කුඩා කැබලි වලට කපා ජලය දැමූ භාජනයකට දමා (දුම්කොළ 100 g ක් වතුර ලිටරයකට) හොඳින් පැසෙන්නට හැර දින 2 කට පමණ පසු අඹරා පෙරා දියරය වෙන්කරවා ගත යුතුය. එම දුම්කොළ සාරය පාදවල ආලේප කරගත් විට හොඳ කුඩලු විකර්ශකයක් ලෙස භාවිතා කළ හැක.

තවද වෙළඳ පොලේ ඇති වේදනා නාශක ද්‍රව්‍යයන් වල අඩංගු වන (Menthol) මෙන්තෝල් සහ (Eucaliptus oil) යුකැලිප්ටස් ඔයිල් වැස්ලින් සමග නියමිත අනුපාතයට මිශ්‍ර කොට සාදාගත් ආලේපනය කුඩැල්ලන් විකර්ශනය කිරීමේ හැකියාවක් ඇත. එබැවින් එම ආලේපනයද භාවිතා කළ හැකි නමුදු එයට එක් කිරි කැපුම් කරුවකුට දිනකට රු. 3.60 ක් පමණ වැයවේ. ඉහත සඳහන් ද්‍රව්‍යයන් අතරින් එකක් පමණක් දිගින් දිගටම භාවිතා නොකොට නිර්දේශ කර ඇති ද්‍රව්‍යයන් කිපයක් මාරුවෙන් මාරුවට භාවිතා කිරීම වඩාත් සුදුසුය.

ඉහත ප්‍රතිකාරක වලට අමතරව තවත් ද්‍රව්‍ය කීපයක් යොදාගෙන අප විසින් අත්හදා බැලූ අතර එම ප්‍රතිකාරක වල යම් යම් අඩුපාඩු හා ඇතැම් ද්‍රව්‍යයන් මිල අධික වන බැවින් ඒවා භාවිතා කිරීම ආර්ථිකව සහ ප්‍රායෝගිකව කිරීමට අපහසු වේ. එබැවින් අප විසින් මෙහිදි හඳුන්වා දි ඇත්තේ හොඳම ප්‍රතිකාරක කිහිපයකි. එම ප්‍රතිකාරක භාවිතා කිරීමෙන් රබර් වගාකරුවන්ට කුඩැල්ලන්ගෙන් මුහුණ පාන ප්‍රායෝගික අපහසුතාව මගහරවා ගත හැකි වන අතර ඒ තුලින් වැඩි රබර් කිරි අස්වැන්නක් ලබාගෙන හොඳ ආදායමක් ලබා ගැනීමට හැකි වේවායි අපේ ප්‍රාර්ථනයයි.

මෙහි සඳහන් කර ඇති ද්‍රව්‍ය චිරාත් කාලයක් සිට වෛද්‍ය විද්‍යාවෙ ප්‍රතිකාර ක්‍රම වශයෙන් භාවිතා කර ඇති ද්‍රව්‍ය බැවින් සමට අහිතකර තත්ත්වයක් ඇතිවේ යැයි නොහැගේ. එබැවින් මෙම ද්‍රව්‍ය එක දිගට භාවිතා නොකොට නිර්දේශ කොට ඇති ද්‍රව්‍යයන් කිහිපයක් මාරුවෙන් මාරුවට පාවිච්චිය සුදුසු බව ලිපිය සංස්කරණයේදි ඇතුලත් කර ඇත.